

# ANKCP 2

## වියළි සහ අතරමැදි කලාප තුළ වගා කළ හැකි

# නව කව්පි ප්‍රභේදයක්

බී. එන්. සමරනායක, එන්. ටී. ප්‍රතාපසිංහ, ඒ. එස්. විජේවර්ධන
මාෂ හා තෙල් බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය, අඟුණකොළපැලැස්ස
එම්. සී. මිල්ලවිතානච්චි, වී පර්යේෂණ ස්ථානය, ලබුදූව

උද්භිද විද්‍යාත්මකව විග්නා අන්ගිකියුලාටා *(Vigna unguiculata)* යන නාමයෙන් හැඳින්වෙන කව්පි අපේ රටේ වියළි සහ අතරමැදි කලාප තුළ වර්ෂාපෝෂිත තත්ත්ව යටතේ සාර්ථකව වගා කළ හැකි මාෂ බෝගයකි. මෙහි ඇති විශේෂත්වය වන්නේ වියළි කලාපය තුළ නිරන්තරව ඇති වන වර්ෂා හිඟ තත්ත්වයන්ට වඩාත් හොඳින් ඔරොත්තුදීමේ හැකියාවයි. ශ්‍රී ලංකාවේ වගා කෙරෙන අනෙකුත් වාර්ෂික බෝග සමග සැසඳීමේදී කව්පි බෝගය සඳහා අවශ්‍ය වන ජල ප්‍රමාණය ඉතාම අවම මට්ටමක පවතී. එම නිසා කිසිදු ජල සම්පාදන ප්‍රභවයක් නොමැතිව අහස් දියෙන් පමණක් වගාවන් සිදු කෙරෙන වියළි කලාපීය ප්‍රදේශ තුළ පවතින වර්ෂාපතන තත්ත්වයන් යටතේ වුවද කව්පි වගාව සාර්ථකව සිදුකළ හැකිය. මෙරට වගා කිරීම සඳහා මේ වන විට බොම්බේ, MI35, ධවල, වරුණි, MICP1, ANKCP1 කව්පි ප්‍රභේද 6 ක් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් වරින් වර නිර්දේශ කර ඇත. මෙයට අමතරව ගොවිමහතුන් විසින් වගා කරමින් පවත්වාගෙන යන කව්පි දර්ශයන් කිහිපයක් අතරින් ''කඩල කව්පි'' ඉතාම ජනප්‍රිය වී ඇත. නමුත් එම දර්ශයෙන් ලැබෙන

අස්වැන්න සාපේක්ෂව අඩුය. ඉල්ලුමට සරිලන සැපයුමක් නැති අතර විශාල වශයෙන් වගා කිරීමට අවශ්‍ය බීජ ද ප්‍රමාණවත් නොවේ.

එනිසා අඟුණකොළපැළැස්ස, මාෂ හා තෙල් බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ මාෂ බෝග අභිජනන අංශය ඉහත කී ''කඩල කව්පි'' දර්ශය වන ජාන ප්ලාස්ම එකතුවේ ඇති AC 00034 හා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව නිර්දේශ ප්‍රභේදයක් වන වැඩි අස්වනු ලබා දෙන MI35 මුහුම් කර වසර 07 ක කාලයක් පර්යේෂණ කටයුතු සිදු කර ගොවි ක්ෂේත්‍ර වල අත්හදා බැලීමෙන් අනතුරුව දැනට කව්පි වගා කරන ප්‍රදේශයන්හි වගා කිරීමට නව ප්‍රභේදයක් 2017 පැවති ප්‍රභේද නිදහස් කිරීමේ කමිටුවේදී නිර්දේශ කරන ලදී. අඟුණකොළපැළැස්ස, මාෂ හා තෙල් බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය විසින් හඳුන්වාදුන් දෙවන කව්පි ප්‍රභේදය ද මෙය වේ.





**හඳුන්වා දුන් නම** - ANKCP 2

**පළමු අස්වැන්න නෙලීමට ගතවන කාලය**

» පැසුණු අමු කරල් ලෙස දින 50 - 55
» වියළි කරල් ලෙස දින 64 - 68

**අස්වනු නෙලා ගත හැකි වාර ගණන**

» පැසුණු අමු කරල් ලෙස වාර 5 - 6
» වියළි කරල් ලෙස වාර 3 - 4

**සාමාන්‍ය අස්වැන්න**

» පැසුණු අමු කරල් ලෙස හෙක්ටයාරයට කිලෝග්‍රෑම් 6000 - 6500
» වියළි බීජ ලෙස හෙක්ටයාරයට කිලෝග්‍රෑම් 1500 - 1600


**වියළි බීජ වල පැහැය**

ලා දුඹුරු සහ සුදු (Bicolor)

**වියළි බීජ 100 ක බර** - ග්‍රෑම් 21

**මෙහි විශේෂ ලක්ෂණ වනුයේ**

» ගොවීන් අතර දැනට ජනප්‍රිය කඩල කව්පි ස්වරූපය ගැනීම නිසා පැසුණු අමු කරල් වලින් බීජ වෙන්කර ව්‍යංජනයක් ලෙස ද ආහාරයට ගත හැකි වීම නිසා අමු කරල් අලෙවි කිරීමේ හැකියාව සහ වියළි බීජ තම්බා ආහාරයට ගැනීමට හැකිවීම (ද්විත්ව භාවිතය Dual purpose)
» පැසුණු අමු බීජ සහ වියළි බීජ ප්‍රමාණයෙන් අනෙක් ප්‍රභේදයන්ට වඩා විශාල නිසා පාරිභෝගික රුචිකත්වය වැඩි වීම.
» බීජ වල පැහැය සඳහා පාරිභෝගික රුචිකත්වය වැඩිවීම.
» වියළි කරල් අස්වනු වාර 3 - 4 ක් නෙළාගත හැකිවීම.



# කන්දොස්කිරියාව. . .

## ඩැයිවර් ඉලංදාරියා

මේ සැරේ පිං බෙහෙත් සාලාවේ බෙහෙත් දුන්නේ කලින් හිටිය වෙද මහත්තයා නෙවේ, අලුත් වෙද මහත්තයෙක්. උන්නැහේට ලෙඩ අල්ලන්න හොඳට තේරෙනවා. නාඩි අල්ලපු ගමන් සරුවාංගේ තියෙන අමාරුකම් ඔක්කොම බලාන හිටියා වගේ කිව්වා. දීපු බෙහෙත් වලට දැන් සෑහෙන්න ගුණයි. උන්නැහේට බුදුබව ලැබෙන්ට තුන්වරුව යනකොට තුනටියේ තිබුණු අමාරුව දෙකෙන් පංගුවට අඩු උනා.

මං බෙහෙත් ටික ඇරන් එනකොට වැටමුල්ලේ ගෙදර කව්රාලගේ මිනිබිරී, පොඩි එකා එකතු කරගෙන එන්ට ළදරු පාසැලට ගිහින් එනවා හම්බැුනා. ඒකී මං ඇරලන්ට අපේ කඩුල්ල ගාවටම ආවා. ඒකී හරි සීදේවී කෙල්ල. උන්ගේ මහැන්දෑ කුසුමාවති ගේ කපාපු පලුව.ඒකී කසාද බැඳලා ඉන්න ඉලංදාරියා ඒ ගෙදර බින්න බැහැලලු. ගම නුවර ඊරියගම පැත්තෙලු. කෘෂිකර්මේ ඩැයිවර් කෙනෙක්ලු. ඒ හාදයා ටික දොහකින් ගෙදර ආවේ නැතිලු. මං ඒකිගෙන් ඇහුවා දෙන්නා දෙමල්ල්ගේ මොකුත් අමනාපයක්වත්ද කියලා. මේ දවස්වල රාජකාරි වැඩ වැඩිවේලාලු. ඉතිං මං ඇහුවා මොනවාද ඔය හැටි තියෙන රාජකාරී කියලා.

ඔය කෘෂිකර්මේ ලංකාව පුරහා තියෙන පරියේසන ඉස්තාන වල මුලාදැනිගොල්ල උන්නැහේලගේ පරියේසන වලින් බිහිකරපු අලුත් වී ජාති, අලුත් බෝග ජාති, අලුතෙන් තෝරලා දෙන වගා පිළිවෙලවල්, පොහොර වර්ග, කෘෂි සත්තු පාලන ක්‍රම ගැන හපන්කම් පුරසාරම් මහා සභාවක් ඉස්සරහා එළිදක්වලා ඒවයේ ගුණදොස් ඉස්මතු කරලා මතු පරම්පරාව වෙනුවෙන් ගොවි ජනතාවට බාරදීමේ මුල් පියවර තියෙන මහ සමුළුවක් අනිද්දා පේරදෙණියේ තියෙනවලු. ඒ වෙනුවෙන් කෘෂිකර්මේ ඉහළ ඉදං පහළ නිලධාරි සේවක මණ්ඩලය දවල් රෑ නොතකා මහන්සි වෙනවලු. දවසක් දෙකක් නිවාඩු දාලා ඒ හාදයා ගෙදර එයිලු.

ඔය මහා සමුලුවවට කෘෂිකර්මේ භාර ඇමතිතුමත්, පිටරට වලින් දැනමුත්තොත් සහභාගී වෙනවාලු. අවුරුද්දක් පාසා ඒක පවත්වනවාලු. ගොවිතැන දියණු කරන්ට වෙහෙස මහන්සි දරපු මුලාදෑනිගොල්ලන්ට තුටු පඩුරු පදක්කම් නම්බුනාම එහෙමත් දෙනවාලු. සමුළුවට නමක් නං කීවා, ඒත් ඒක මට මතක නෑ. ඒ කොයි හැටි වෙතත් ගොවිතැන කියන එක ඉස්සර වගේ සරුවාල කොටයක් ගහගෙන මුලු සරුවාංගේ පුරා මඩගාගෙන කරන්ට පුලුවන් එකක් නෙවෙයි දැං. ලොකේ වෙනස් වෙන විදියට ඒකත් වෙනස් වෙන්න ඕනෑ. හොඳ ගතිගුණ තියෙන බෝග ජාති මතු පරම්පරාවට ඇතිකර දෙන්න ඕනෑ. වවන්ට ඔබින තැන්වල විතරක් වවලා අනික් තැන් වැඩකට ඇති දේට යොදවන්ට ඕනෑ. මහපොළව පරිසරය රැකෙන්ටත් ඕනෑ. අඩුවියදම් ගොවිතැන් ක්‍රම ගැන හොයා බලන්ට ඕනෑ. ඔක්කොටමත් වැඩිය තරුණ පරම්පරාවට ගොවි තැනට ඇල්ම බැල්ම ඇතිවෙන වැඩපිළිවෙලවල් ඇතිකරන්ට ඕනෑ. හැමදේටම දැන උගත් ඇත්තන් මගපෙන්වන්ට ඕනෑ.

එහෙම නැති උනොත් අපි හැමෝටම පිටරටින් කෑම ටික එනකං බලන් ඉන්න වෙයි ඕං . .

සීලිං අක්කා

